සමාගමේ ලේකම්වරු.

07 - 307

---

## සමාගම් නාමය වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි

(2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වගන්තිය අනුගාමීව)

කලින් නාමය : ශ්‍රී ගනේෂා එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 00284979
අලුත් නාමය : බ්ලූ බ්ලිස් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 13, ද සිල්වා පටුමග, වටරප්පල පාර, ගල්කිස්ස

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

ගිහාන් එම්බීසී කොලිෆයිඩ් සෙක්‍රටරීස් ඇන්ඩ්
කෝපරේට් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.
0775436401.

07-346

**සමාගමේ නාමය වෙනස් කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් ආඥා පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත නම් සඳහන් සමාගමේ නාමය 2024 අප්‍රේල් 1 දින සිට වෙනස් කර ඇති බව දන්වමු.

| | | |
|---|---|---|
| සමාගමේ පෙර නාමය | : | ඒ ටී එස් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සමාගමේ නව නාමය | : | එම්අයිසීඩී ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සමාගමේ අංකය | : | PV 15117 |
| ලියාපදිංචි ලිපිනය | : | අංක 56, පූජ්‍ය ශ්‍රී ධම්මරතන මාවත, මාදිවෙල, කෝට්ටේ. |

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

07 - 104

---

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

**උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම - 2025 වර්ෂය

1982 වර්ෂයේ අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ 1983 වර්ෂය හා ඊට පසු කාල පරිච්ඡේදය සඳහා විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී වලංගුව පවත්නා සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහිම බලපානු ලබන පොදු සුරාබදු කොන්දේසිවලටත් යටත්ව, 2025 වර්ෂය තුළ විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිලදී ගැනීම සඳහා උඩපළාත ප්‍රාදේශීය ලේකම් තැන වන, මා විසින් **2024.08.07 වැනි දින පෙ. ව. 10.30** තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නිසි ආකෘති පත්‍රයකින් සමන්විත විය යුතු අතර,

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් මුදලක් තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක්, *සහ*

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපළ පිළිබඳ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කෙරේ. ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවය සම්බන්ධයෙන් විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය :

(i) ටෙන්ඩර් පත්‍ර මුළුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය;

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍ර පෝරමවල නියමිත සාක්ෂිකරුවන් අත්සන් යොදා තිබිය යුතු ය;

(iii) සෑම වෙනස් කිරීමක් හෝ කපා හැරීමක්ම ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන සහ දිනය යොදා සහතික කර තිබිය යුතු ය.

මෙහි නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත්ව සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍ර,

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක තැන්පත් කර ලබා ගන්නා ලද කුවිතාන්සියක්, හා

*(ආ)* වත්කම් සහතිකයක් සමග,

ලියුම් කවරයක බහා මුද්‍රා තබා ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරේ තැබෑරුම් අංකය සහ නම සඳහන් කර උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට ප්‍රථම තැන්පත් කළ යුතුය. එසේ *නැතහොත්* ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථම උඩපළාත ප්‍රාදේශීය ලේකම් තැනට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. එක් එක් රේන්දයක් වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන වේලාව පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇත. එකී වේලාවන්හි දී සියලුම ටෙන්ඩර්කරුවන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක ටෙන්ඩරයක් ඉදිරිපත් කර "වරප්‍රසාදය මිල දී ගත් තැනැත්තා"යැයි ප්‍රකාශ කරනු ලැබූ පසු එම දින ප. ව. 2.30ට පෙර උඩපළාත ප්‍රාදේශීය ලේකම් තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කොට යට කී විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය. මෙම ගෙවීම් මුදලින් හෝ බැංකුව විසින් ''ගෙවීම් සඳහා'' ලකුණු කළ චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් හෝ ආරක්ෂිත චෙක්පත් නමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ විය යුතු ය.

06. පූර්වෝක්ත දිනයේ දී විකිණීමට නොහැකි වූ තැබෑරුම් රේන්ද **2024.09.04** වැනි දින පෙරවරු **10.30**ට නැවත විකිණීම සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම ද මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. වැඩි විස්තර උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා දැනගත හැකි ය.

ආත්මා දිලුක්ෂි ජයරත්න,
ප්‍රාදේශීය ලේකම්,
උඩපළාත- ගම්පොල.

2024 ජූනි මස 18 වැනි දින,
ගම්පොල, උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

2025 වර්ෂය සඳහා ගම්පොල උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත කරන ලද
විදේශ මත්පැන් තැබෑරුම් ලැයිස්තුව

| *අංකය හා නම* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කර තබන වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය සහ වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශත* |
|---|---|---|---|---|---|
| 01. පුස්සැල්ලාව විදේශ මත්පැන් තැබෑරුම | උඩපළාත | පුස්සැල්ලාව නගර සීමාව තුළ | පෙ. ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 2024.08.07 වැනි දින පෙ. ව. 10.30 | 3,000.00 |

07 - 301/1

## මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

### මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම - 2024/2025

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ 1983 වර්ෂයේ හා ඊට පසු කාල පරිච්ඡේදය සඳහා විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත් එම කාලය තුළ දී වලංගුව පවත්වාගෙන යනු ලබන සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහි බලපාන පොදු සුරාබදු කොන්දේසිවලටත් යටත්ව 2024/2025 වර්ෂය තුළ විදේශ මත්පැන් සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිල දී ගැනීම සඳහා මහනුවර, කඩවත් සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය ලේකම් වන මා විසින් **2024.08.13 වැනි දින පෙරවරු 10.30** වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි ආකෘති පත්‍රයකින් සකස් විය යුතු අතර,

(අ) ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත සඳහන් කර ඇති අන්දමට ටෙන්ඩර් ඇප මුදලක් තැන්පත්කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් ; *සහ*

(ආ) ටෙන්ඩර්කරුගේ ඉඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතා ගැන විශේෂයෙන් සැළකිලිමත් විය යුතු ය.

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවිය යුතු ය.
(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයෙ හි සාක්ෂිකරුවන්ගේ අත්සන් යොදා තිබිය යුතු ය.
(iii) සෑම වෙනස් කිරීමක් හෝ වචන කපා හැරීමක් මත ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන සහ දිනය යොදා සහතික කර තිබිය යුතු ය.
(iv) අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ ටෙන්ඩර් පත්‍රය, ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කර ලබා ගන්නා ලද,

(අ) ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ කුවිතාන්සිය ; *සහ*
(ආ) වත්කම් සහතිකයක්,

සමග ලියුම් කවරයක බහා, මුද්‍රා තබන ලද ලියුම් කවරයෙහි වම් ඉහළ කෙළවරේ "තැබෑරුමේ නම සහ අංකය" සඳහන් කර මහනුවර කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට ප්‍රථම තැන්පත් කළ යුතුය. එසේ *නැතහොත්* ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර මහනුවර ප්‍රාදේශීය ලේකම් තැනට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. එක් රේන්දයක් වෙනුවෙන් භාරගැනීම අවසන් කරන වේලාව උපලේඛනයෙ හි සඳහන් කර ඇත. එම වේලාවන්හි දී සියලුම ටෙන්ඩර්කරුවන් මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක ලෙස ටෙන්ඩර් ඉදිරිපත් කළ අය අතුරින් වරප්‍රසාද මිල දී ගත් තැනැත්තායි ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු එම තැනැත්තා විසින් එම දින **පස්වරු 2.30** ට පෙර මහනුවර ප්‍රාදේශීය ලේකම් තැන විසින් නියම කරනු ලබන මුදලක් ඇප වශයෙන් මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.

මෙම ගෙවීම මුදලින් හෝ බැංකුවක් විසින් "**ගෙවීම සඳහා**" යැයි ලකුණු කළ චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් "**ආරක්ෂිත චෙක්පත**" නමැති ස්වරූපයකින් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට නිකුත් කරන ලද චෙක්පතකින් ගෙවිය යුතු ය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට මත්පැන් තැබෑරුම් කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය.

06. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකිය.

07. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු වශයෙන් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතු ය.

08. විදේශ මත්පැන් තැබෑරුම් හෝ වෙනත් බලපත්‍රයක් ලත් ස්ථානවල හෝ විකිණීම සඳහා තොග විදේශ මත්පැන් නිකුත් නොකරනු ලබන බව සැළකිය යුතු ය.

09. මහනුවර ඇසළ පෙරහැර සමයේ දී හා වෙනත් හේතූන් මත මෙහි උපලේඛනයේ සඳහන් අංක 01 දරන විදේශ මත්පැන් තැබෑරුම තාවකාලිකව වසා තැබීමට නියෝගයක් නිකුත් කිරීමට මා හට සිදුවුවහොත් එම වසා තැබීමේ කාලය තුළ දී රේන්ද වාරික සහන සැලසීමක් කරනු නොලැබේ.

10. පූර්වෝක්ත දිනයේ දී විකිණීමට නොහැකිවූ විදේශ මත්පැන් තැබෑරුම්, නැවත විකිණීම **2024.09.10** වැනි දින **පෙ.ව. 10.30** ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

11. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසන් තීරණය වේ.

12. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි හෝ වෙනත් වැඩි විස්තර මෙම කාර්යාලයෙන් විමසා දැනගත හැකි ය.

යූ. ජේ. එම්. එස්. එස්. බී. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර, කඩවත් සතර සහ ගඟවට කෝරළය.

2024 ජුනි මස 07 වැනි දින,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

**2024/2025 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද විදේශ මත්පැන් තැබෑරුම් ලැයිස්තුව**

| *අනුක්‍රමික අංක/ කොට්ඨාසය/තැබෑරුම් පිහිටවිය යුතු කොට්ඨාසය/තැබෑරුම* | *කොට්ඨාසය* | *තැබෑරුම් පිහිටුවිය යුතු කොට්ඨාසය* | *විවෘත කරන වෙලාවන්* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය සහ වේලාව* |
|---|---|---|---|---|
| 01<br>අංක 1 : කොළඹ වීදිය | මහනුවර නාගරිකයේ අංක 17 යටිනුවර සහ අංක 18 කොටුගොඩැල්ල වීදිය | මහනුවර නාගරිකයේ අංක 17 යටිනුවර සහ අංක 18 කොටුගොඩැල්ල ඡන්ද කොට්ඨාසය තුළ කොළඹ වීදිය සහ කාසල්හිල් වීදිය මංසන්ධියෙන් කොළඹ වීදිය, වඩුගොඩපිටිය පාරේ මංසන්ධියටත් අතර කොළඹ වීදිය දෙපාර්ශවයේ | පෙ.ව. 10.00 සිට ප.ව. 9.00 දක්වා | 2024.08.13 වැනි දින පෙ.ව. 10.30 |

විදේශ මත්පැන් තැබෑරුම් සඳහා තැන්පත් කළ යුතු ටෙන්ඩර් තැන්පත් මුදල - 2024/2025

| |
|---|
| අංක 1 කොළඹ වීදිය විදේශ මත්පැන් තැබෑරුම් රේන්දය - රුපියල් 5,000. |

07 - 98/2

## නෝර්වුඩ් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

### 2024/2025 වර්ෂයේ විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ 1983 වර්ෂයට සහ ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු විදේශ මත්පැන් (ධාන්‍ය වලින් මෙරට නිපදවන ලද බීම වර්ග ඇතුළුව) තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත් එම කාලය තුළ දී බලපවත්නා සෑම සුරාබදු කොන්දේසියකටම යටත්ව 2024/2025 වර්ෂයේ දී පහත සඳහන් උප ලේඛණයේ දැක්වෙන විදේශ මත්පැන් (ධාන්‍ය වලින් මෙරට නිපදවන ලද බීම වර්ග ඇතුළුව) සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා නෝර්වුඩ් ප්‍රාදේශීය ලේකම් විසින් **2024.08.08 වැනි දින පෙරවරු 10.30** වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. (අ) සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමයක් මගින් ඉදිරිපත් කළ යුතුය.

(ආ) ඇප තැන්පත් මුදල් වශයෙන් දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට පහත උපලේඛනයේ දැක්වෙන ආකාරයට ටෙන්ඩර් මුදල් තැන්පත් කර ලබාගන්නා නිල කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

(ඇ) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමඟ ඉදිරපත් කළ යුතුය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම පිළිබඳව යථෝක්ත විදේශීය මත්පැන් තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදය යුතුය.

(ඈ) ටෙන්ඩර් පත්‍රය සම්පූර්ණ කිරීමේදී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැලකිලිමත් විය යුතුය.

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති ගණන් ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවිය යුතු ය.

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන්වලට අමතරව ජාතික හැඳුනුම්පත් අංකය ද යෙදිය යුතුය.

(iii) සෑම වෙනස් කිරීමක්ම/කපා හැරීමක්ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන හා දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය.

(iv) සෑම සාර්ථක ටෙන්ඩර්කරුවෙක්ම ටෙන්ඩර් පෝරම සමඟ තමන්ගේ සහතික කරන ලද ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ ටෙන්ඩර් පත්‍රය, ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබාගන්නා ලද නිල කුවිතාන්සිය සහ වත්කම් පිළිබඳ සහතිකය සමඟ ලියුම් කවරයක බහා, සීල් තබා කවරයේ වම් කෙළවරේ මුදුනේ නියමිත තැබෑරුම් අංකය හා නම සඳහන් කර නෝර්වුඩ් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතුය. ටෙන්ඩර් තැපෑලෙන් එවන්නේ නම් ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර නෝර්වුඩ් ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර භාරගැනීමේ අවසන් වේලාව පහත සඳහන් උප ලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් නෝර්වුඩ් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

05. ඕනෑම ටෙන්ඩරක් භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතුය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ගැනුම්කරු ලෙස ප්‍රකාශයට පත්කළ වහාම එදින ප.ව.2.00 ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන් නෝර්වුඩ් ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක් නෝර්වුඩ් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කළ යුතුය. මෙම මුදල ප්‍රාදේශීය ලේකම් මගින් ගිනිගත්හේන මහජන බැංකුවේ වර්ෂයක ස්ථිර තැන්පතු ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතුය. මෙම තැන්පතු මුදලින් හෝ බැංකුව විසින් ගෙවීම සඳහා යන්න සටහන් කරන ලද චෙක්පතකින් හෝ මහජන බැංකුවෙන් "ආරක්ෂිත චෙක්පතක්" ස්වරූපයෙන් ගෙවිය යුතුය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට හා කොන්ත්‍රාත්තුවකට අත්සන් තැබිය යුතුය.

07. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

08. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු වශයෙන් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතුය.

09. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත් ඒවා 2024.09.05 පෙ.ව. 10.30 ට මෙම ස්ථානයේ දී ම නැවත විකුණනු ලැබේ.

10. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසන් තීරණය වේ.

11. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර සඳහා නෝර්වුඩ් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසීම් කළ යුතුය.

**උපලේඛනය**

**විදේශ මත්පැන් තැබෑරුම්**

| *අංකය* | *තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටිය යුතු ස්ථානය* | *ටෙන්ඩර් භාරගැනීමේ අවසන් වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල* |
|---|---|---|---|---|
| 01 | නෝර්වුඩ් | නෝර්වුඩ් නගර බල ප්‍රදේශය අංක 03 තුල | 2024.08.08 පෙ.ව. 10.30 | රු. 5,000/- |
| 02 | දික්ඔය | හැටන් - දික්ඔය නගර සභා සීමාවේ කොට්ඨාස අංක 04 තුළ | 2024.08.08 පෙ.ව. 10.30 | රු. 5,000/- |
| 03 | දික්ඔය | හැටන් - දික්ඔය නගර සභා සීමාවේ කොට්ඨාස අංක 05 තුළ | 2024.08.08 පෙ.ව. 10.30 | රු. 5,000/- |

අයි. එම්. සේනානායක,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - නෝර්වුඩ්.

2024 ජුනි මස 27 වැනි දින,
නෝර්වුඩ් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 349

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය**

ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී, එහි ලියාපදිංචි කාර්යාලය සහ/හෝ ප්‍රධාන ව්‍යාපාර ස්ථානය කොළඹ 01, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවතේ, අංක 21 දරන ස්ථානයේ පිහිටා ඇත. "බියගම ශාඛාව" යනුවෙන් සඳහන් කරනු ලබන ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාර ස්ථානයක්, බියගම, මල්වාන, වල්ගම, අංක 536/30 දරන ස්ථානයේ පිහිටා ඇත.

........................ *පැමිණිලිකරු.*

*නඩු අංකය* : CHC/250/2017/MR
*ස්වභාවය* : උකස්
*වටිනාකම* : රු. 8,066,622.82
*කාර්ය පටිපාටිය* : සාමාන්‍ය

*එදිරිව*

සමරකෝන් මුදියන්සේලාගේ කුඹුරේ ගෙදර රවිඳු තරංග ඒකනායක,
අංක 34, මාකොළ දකුණ,
මාකොළ.

දැනට

අංක : 155/19,
කඳුබොඩ,
දෙල්ගොඩ.

........................ *විත්තිකරු.*

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරී පත්‍රය අනුව, වර්ෂ 2022 ක් වූ නොවැම්බර් මස 11 වැනි දින මෙම නඩුවේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව පැමිණිලිකරුගේ වාසියට තීන්දු ප්‍රකාශය ඇතුළත් කර ඇත.

පැමිණිල්ලේ ආයාචනයේ (අ) ඡේදයේ අයැද ඇති පරිදි රු. 1,623,211.84 ක මුදලක් (රුපියල් එක් මිලියන හය ලක්ෂ විසි තුන් දහස් දෙසිය එකොළහයි ශත අසූ හතරක්) සහ රු. 1,367,388.64 ක් වූ මුදල මත 2016.07.04 වැනි දින සිට නඩු තීන්දුවේ දින තෙක් වර්ෂයට 13.5% පොළියක් ද, එතැන් සිට ඒ මුදල සම්පූර්ණයෙන් බේරුම් කරනු ලබන තෙක් නෛතික පොළිය ද, සමග විත්තිකරු විසින් පැමිණිලිකාර බැංකුවට ගෙවිය යුතු බවට මෙයින් නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

පැමිණිල්ලේ ආයාචනයේ (ආ) ඡේදයේ අයැද ඇති පරිදි රු. 6,443,410.98 ක මුදලක් (රුපියල් හය මිලියන හාර ලක්ෂ හතළිස් තුන් දහස් හාරසිය දහයයි ශත අනූ අටක්) සහ රු. 5,601,382.02 ක් වූ මුදල මත 2016.07.04 වැනි දින නඩු තීන්දුවේ දින තෙක් වර්ෂයට 13% ක පොළියක් ද, එතැන් සිට ඒ මුදල සම්පූර්ණයෙන් බේරුම් කරනු ලබන තෙක් නෛතික පොළිය ද, සමග විත්තිකරු විසින් පැමිණිලිකාර බැංකුවට ගෙවිය යුතු බවට මෙයින් නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

තවද විත්තිකරු විසින් පැමිණිලිකාර බැංකුවට මෙම නඩුවේ තක්සේරු කර ලද නඩු ගාස්තු ගෙවිය යුතු බවටත් මෙයින් නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

පැමිණිල්ලේ සහ මෙහි පහත උපලේඛනයේ සහ/හෝ C සහ G වශයෙන් සලකුණු කොට පැමිණිල්ල සමග ඉදිරිපත් කර ඇති උකස් බැඳුම්කරවල උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම හා පරිශ්‍රය පැමිණිල්ලේ (අ) (ආ) සහ (ඇ) අයැදීම්වල අයැදි ඇති ඉහත කී මුදල් ප්‍රමාණයන් ගෙවීම සඳහා බැඳී පවතින බවට හා ක්‍රියාවේ යෙදවිය හැකි බවට මෙයින් නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

වර්ෂ 2022 ක් වූ නොවැම්බර් මස 11 වැනි දින කොළඹ වාණිජ මහාධිකරණයේ නඩු තීන්දුව ඉටු කිරීමට විත්තිකරු අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී,

වර්ෂ 2024 ක් වූ අගෝස්තු මස 07 වැනි දින පෙ.ව. 11.30 ට,

මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළය (බස්නාහිර) අධිකාරී පත්තුවේ බියගම ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 242 නැගෙනහිර කඳුබොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසයට අයත් කඳුබොඩ පිහිටා ඇත්තා වූ ද, කඳුබොඩ එස්ටේට් (කොටසක්) වශයෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. කොළඹගේ විසින් සාදන ලද අංක 1460/ 2010 හා 2010 ජුනි මස 05 වැනි දින දරන පිඹුරේ නිරූපිත X බිම් කැබැල්ල වශයෙන් සලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුලු ඉඩම් කැබැල්ල හා ඒ මත පිහිටි පස, ගහකොළ, වැව්ලි හා වෙනත් සියලු දේ ද සමඟ වේ. තවද එකී ඉඩමට මායිම් උතුරින් : බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද අංක 8144 දරන පිඹුරේ B2A බිම් කැබැල්ලෙන්, නැගෙනහිරින් (අඩි 15 ක් පළල ඇති) අංක 1893 දරන පිඹුරේ අංක 31 බිම් කැබැල්ලෙන්, දකුණින් : අංක 1893 පිඹුරේ අංක 15 බිම් කැබැල්ලෙන් හා බස්නාහිරින් : අංක 1893 දරන පිඹුරේ අංක 21 බිම් කැබැල්ලෙන් මායිම් වූ ද, ප්‍රමාණයෙන් පර්චස් දහසය (පර්. 16) නැතහොත් හෙක්ටයාර් 0.0405 කින් යුක්ත වේ.

අංක 1460/2010 දරන පිඹුරේ X වශයෙන් සලකුණු කර ඇති බිම් කැබැල්ල පහත විස්තර කරනු ලබන අංක 1893 දරන පිඹුරේ අංක 14 බිම් කැබැල්ලේ නැවත මැනීමක් වේ.

ඉහත කී කඳුබොඩ පිහිටා ඇත්තා වූ ද, කඳුබොඩ එස්ටේට් (කොටස) යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ජී. පී. හස්තනායක විසින් සාදන ලද 1893 හා 1998 ජනවාරි 18 වැනි දින දරන පිඹුරේ නිරූපිත අංක 14 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුලු ඉඩම් කැබැල්ල හා ඒ මත පිහිටි පස, ගහකොළ, වැව්ලි හා වෙනත් සියලු දේ ද සමග වේ. තවද එකී ඉඩමට මායිම් උතුරින් : බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද අංක 8144 දරන පිඹුරේ B2A බිම් කැබැල්ලෙන්, නැගෙනහිරින් අංක 31 බිම් කැබැල්ලෙන්, දකුණින් : අංක 15 බිම් කැබැල්ලෙන් හා බස්නාහිරින් : අංක 21 බිම් කැබැල්ලෙන් මායිම් වූ ද, ප්‍රමාණයෙන් පර්චස් දහසයකින් (පර්. 16) *නැතහොත්* හෙක්ටාර් 0.0405 කින් යුක්ත වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 609/56 වෙලුමේ/පත්‍රිරුවේ ලියාපදංචි කර ඇත.

මෙම බිම් කැබැල්ලට බලයලත් මිනින්දෝරු පී. ජී. පී. හස්තනායක විසින් සාදන ලද අංක 1893 හා 1998 ජනවාරි මස 18 වැනි දින දරන පිඹුරේ අංක 13 හා 31 පාරක් සඳහා වෙන් කරන ලද බිම් කොටස් ඔස්සේ හා ඒ මතු පිටින් මාර්ග අයිතියද සමග වේ.

*ඉඩමට පිවිසීම.*- සියඹලාපේ හංදියේ සිට නව නුවර පාර ඔස්සේ දෙල්ගොඩ නගරය දක්වා දළ වශයෙන් කිලෝමීටර් 3.5 ක දුරක් ගමන් කර පූගොඩ පාරට දකුණට හැරී කිලෝමීටර් 2.1 ක් ගමන් කර කඳුබොඩ එස්ටේට් පාරට වමට හැරී (මූකලාන හංදියට මීටර් 200 ක් පමණ කලින්) මීටර් 5 ක් පමණ ගමන් කර අඩි 15 පළල බොරළු පාරට වමට හැරී එම අතුරු පාරෙන් නැවත මීටර් 75 ක් ගමන් කළ විට වම් අත පැත්තේ ඇති විෂයගත දේපළ වෙත ළඟා විය හැක.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

01. ගැණුම්කරුවන් විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%) ක් ගෙවිය යුතුය.
02. පළාත් සභා ගාස්තු හෝ රජයේ ගාස්තු
03. නොතාරිස් ගාස්තු, ගමන් ගාස්තු සහ විකිණීමේ කොන්දේසි සකස් කිරීමේ ගාස්තුව රු. 10,500/-
04. සියලුම ප්‍රචාරක වියදම්
05. වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු (සිවිල් නීති සංග්‍රහයේ 258 වැනි වගන්තිය අනුව),
06. ලිපිකරු, බෙරකරු සහ සෝෂක ගාස්තුව රු.4,500/-
07. ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑපහ (75%) මුදල දින 30 ක් ඇතුළත දී කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත සඳහන් නඩුවට තැන්පත් කළ යුතුයි.

ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජොෂ්ඨ වෙන්දේසිකරු, තක්සේරුකරු හා
උසාවි කොමසාරිස්, වාණිජ මහාධිකරණය සහ
කොළඹ දිසා අධිකරණයේ සහ ගාල්ල දිසා අධිකරණයේ
බලයලත් වෙන්දේසිකරු - රාජ්‍ය හා වාණිජ බැංකු,

අංක 7/1/10, 1 වන මහළ,
සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
බොරැල්ල, කොළඹ 08.
දුරකථන : 011-2396520
ඊ මේල් : senaservice84@gmail.com

සමරරත්න ඇසෝසියේට්ස්,
නීතිඥවරු සහ නොතාරිස්වරු,
අංක 810, 2 වන මහළ,
මරදාන පාර, කොළඹ 10.
දුරකථන : 0112672262/0112672263
ෆැක්ස් : 0112683073

07 - 99

---

**බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය**

ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී, අංක 21, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත, කොළඹ 01 සහ අතුරුගිරිය, කෙලින් වීදියේ, අංක 51 දරන ස්ථානයේ, "අතුරුගිරිය ශාඛාව" යනුවෙන් සඳහන් කරනු හා හඳුන්වනු ලබන ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇත්තේ ය.

........................ පැමිණිලිකරු.

| | | |
|---|---|---|
| නඩු අංකය | : | HC Civil 557/15/MR |
| ස්වභාවය | : | උකස් |
| වටිනාකම | : | රු. 5,183,582.56 |
| කාර්ය පටිපාටිය | : | සාමාන්‍ය |

*එදිරිව*

රත්නායක මුදියන්සෙලාගේ ලලිත් චමින්ද කුමාර රත්නායක,
අංක 543/16,
බෲක්ලන්ඩ් එස්ටේට්,
තල්දියාවල, අතුරුගිරිය.

........................විත්තිකරු.

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරී පත්‍රය අනුව, වර්ෂ 2019 ක් වූ ජූලි මස 29 වැනි දිනැති තීන්දුව අනුව වර්ෂ 2023 මාර්තු මස 07 වැනි දින පැමිණිලිකරුගේ වාසියට තීන්දු ප්‍රකාශය ඇතුළත් කර ඇත.

ඒ අනුව පැමිණිල්ලේ (අ) ඡේදයේ අයැද ඇති පරිදි රු. 4,180,600/- ක් රු. 1,002,982.56 ක් ලෙස සමස්ථය රු. 5,183,582.56 ක මුදලක්, සහ රු. 4,180,600/- ක් වූ එකී මුදල මත 2014 මැයි මස 25 වැනි දින සිට ඒ මුදල සම්පූර්ණයෙන් හා අවසාන වශයෙන් බේරුම් කරනු ලබන තෙක් වර්ෂයකට 16% ක වැඩිදුර පොළියක් ගෙවිය යුතු බවට නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

තවද ඉහත නම් සඳහන් විත්තිකරු විසින් පැමිණිලිකරුට අධිකරණයේ නිලධාරියකු විසින් නියමිත පරිදි තක්සේරු කරනු ලබන මෙම නඩුවේ නඩු ගාස්තු ගෙවිය යුතු බවට ද නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

පැමිණිල්ලේ සහ මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම ඉහත කී මුදල් ප්‍රමාණයන් ගෙවීම සඳහා බැඳී පවතින බවට හා ක්‍රියාවේ යෙදවිය හැකි බවට නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

වර්ෂ 2019 ක් වූ ජූලි මස 29 වැනි දින කොළඹ වාණිජ මහාධිකරණයේ නඩු තීන්දුව ඉටු කිරීමට විත්තිකරු අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී,

**වර්ෂ 2024 ක් වූ අගෝස්තු මස 08 වැනි දින පෙ.ව. 11.30 ට,**

මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, අංක 490 B, තල්දියවල ග්‍රාම නිලධාරී කොට්ඨාසය හා මාලඹේ ප්‍රාදේශීය සභා කොට්ඨාසය ඇතුළත අතුරුගිරිය පිහිටා ඇත්තා වූ ද, උතුරින් : මෙහි අංක 14 බිම් කැබැල්ලෙන්, නැගෙනහිරින් : අංක 18 බිම් කැබැල්ලෙන් (අඩි 20 ක් පළල ඇති පාරක් සඳහා වෙන් කරන ලද බිම් කැබැල්ල) දකුණින් අංක 17 බිම් කැබැල්ලෙන් (අඩි 30 ක් පළල ඇති පාරක් සඳහා වෙන් කරන ලද බිම් කැබැල්ල) සහ බස්නාහිරින් : මෙහි අංක 15 කැබැල්ලෙන් මායිම් වූ ද, බලයලත් මිනින්දෝරු ජී. බී. දොඩන්වෙල විසින් සාදන ලද අංක 5280 හා 2005 ජනවාරි මස 07 වන දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් දහයකින් (පර්. 10) (හෙක්ටයාර් 0.0253) යුක්ත වූ ද, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 1567/35 වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, "බෲක්ලන්ඩ් එස්ටේට්" යනුවෙන් සඳහන් කරනු ලබන ඉහත කී අංක 5280 දරන මැනුම් පිඹුරේ නිරූපිත, අංක 16 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද නිශ්චිත මුලු ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, පස, ගහකොළ හා වෙනත් සියලු දේ ද සමඟ වේ.

මෙහි පහත වඩාත් සවිස්තරව විස්තර කර ඇති පාරක් සඳහා වෙන් කරන ලද බිම් කැබලි මතුපිටින් හා ඒ ඔස්සේ මාර්ග අයිතිය ද සමග වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, අතුරුගිරිය පිහිටා ඇත්තා වූ ද, උතුරින් : මෙහි අංක 4 බිම් කැබැල්ලෙන්, නැගෙනහිරින් : මෙහි අංක 5 බිම් කැබැල්ලෙන්, දකුණින් මෙහි අංක 19 බිම් කැබැල්ලෙන් සහ බස්නාහිරින් : මෙහි අංක 7 බිම් කැබැල්ලෙන් (අඩි 15 ක් පළල ඇති පාර) මායිම් වූ ද, බලයලත් මිනින්දෝරු ජී. බී. දොඩන්වෙල විසින් සාදන ලද අංක 5280 හා 2005 ජනවාරි මස 07 වන දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් දෙකයි දශම දෙකයි හයකින් (පර්. 2.26) (හෙක්ටයාර් 0.0057) කින් යුක්ත වූ ද, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 1567/36 වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, "බෲක්ලන්ඩ් එස්ටේට්" යනුවෙන් සඳහන් කරනු ලබන ඉහත කී අංක 5280 දරන මැනුම් පිඹුරේ නිරූපිත, අංක 6 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කරන ලද (අඩි 12 ක් පළල ඇති පාර) බෙදා වෙන් කරන ලද නිශ්චිත මුලු ඉඩම් කැබැල්ල වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, අතුරුගිරිය පිහිටා ඇත්තා වූ ද, උතුරින් : මෙහි අංක 3 බිම් කැබැල්ලෙන්, (ළිඳ සඳහා වෙන්කරන ලදී) සහ මෙහි අංක 4 බිම් කැබැල්ලෙන් නැගෙනහිරින් : අංක 6 බිම් කැබැල්ලෙන් (අඩි 12 ක් පළල ඇති පාර) සහ මෙහි අංක 19, 20, 21 හා 22 බිම් කැබලිවලින් දකුණින් මෙහි අංක 18 බිම් කැබැල්ලෙන් (අඩි 20 ක් පළල ඇති පාර) සහ බස්නාහිරින් : අංක 11, 10, 9 සහ 8 (අඩි 12 ක් පළල ඇති පාර) බිම් කැබලි වලින් මායිම් වූ ද, බලයලත් මිනින්දෝරු ජී. බී. දොඩන්වෙල විසින් සාදන ලද අංක 5280 හා 2005 ජනවාරි මස 07 වන දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම හතයි හතරකින් (පර්. 7.74) (හෙක්ටයාර් 0.0196) කින් යුක්ත වූ ද, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 1567/37 වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, "බෲක්ලන්ඩ් එස්ටේට්" යනුවෙන් සඳහන් කරනු ලබන ඉහත කී අංක 5280 දරන මැනුම් පිඹුරේ නිරූපිත, අංක 7 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කරන ලද (අඩි 15 ක් පළල ඇති පාර) බෙදා වෙන් කරන ලද නිශ්චිත මුලු ඉඩම් කැබැල්ල වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, අතුරුගිරිය පිහිටා ඇත්තා වූ ද, උතුරින් : මෙහි අංක 2 බිම් කැබැල්ලෙන්, නැගෙනහිරින් : අංක 7 බිම් කැබැල්ලෙන් (අඩි 15 ක් පළල ඇති පාර) දකුණින් : මෙහි අංක 9 බිම් කැබැල්ලෙන්

සහ බස්නාහිරින් : අංක 1 බිම් කැබැල්ලෙන් මායිම් වූ ද, බලයලත් මිනින්දෝරු ජී. බී. දොඩන්වෙල විසින් සාදන ලද අංක 5280 හා 2005 ජනවාරි මස 07 වැනි දින දරන මැනුම් පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් දෙකයි දශම පහයි අටකින් (පර්. 2.58) (හෙක්ටයාර් 0.0065) කින් යුක්ත වූ ද, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 1567/209 වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, "බෲක්ලන්ඩ් එස්ටේට්" යනුවෙන් සඳහන් කරනු ලබන ඉඩමේ ඉහත කී අංක 5280 දරන මැනුම් පිඹුරේ නිරූපිත, අංක 8 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කරන ලද (අඩි 12 ක් පළල ඇති පාර) බෙදා වෙන් කරන ලද නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, අතුරුගිරිය පිහිටා ඇත්තා වූ ද, උතුරින් : අංක 15, 16 හා 18 (අඩි 20 ක් පළළ ඇති පාර) බිම් කැබලිවලින්, නැගෙනහිරින් : අංක 26 හා 27 (අඩි 10 ක් පළල ඇති පාර) බිම් කැබලිවලින් දකුණින් : අංක 30, 31 සහ 32 බිම් කැබලිවලින් සහ බස්නාහිරින් : බලයලත් මිනින්දෝරු පී. පුංචිහේවා විසින් සාදන ලද අංක 2086 හා 2004 ජනවාරි මස 25 වැනි දින දරන පිඹුරේ නිරූපිත අංක 7 බිම් කැබැල්ලෙන් (අඩි 20 පළල ඇති පාරක් සඳහා වෙන් කරන ලද ඉඩම) මායිම් වූ ද, බලයලත් මිනින්දෝරු ජී. බී. දොඩන්වෙල විසින් සාදන ලද අංක 5280 හා 2005 ජනවාරි මස 07 වැනි දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම බිංදුවයි පහකින් (පර්. 10.05) (හෙක්ටයාර් 0.0254) කින් යුක්ත වූ ද, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 1567/39 වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, "බෲක්ලන්ඩ් එස්ටේට්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් එකී අංක 5280 දරන මැනුම් පිඹුරේ නිරූපිත, අංක 17 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කරන ලද (අඩි 30 ක් පළල ඇති පාර) බෙදා වෙන් කරන ලද නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, අතුරුගිරිය පිහිටා ඇත්තා වූ ද, උතුරින් : අංක 11, 22 හා 7 බිම් කැබලිවලින් (අඩි 15 ක් පළළ ඇති පාර) නැගෙනහිරින් : මෙහි අංක 22, 23, 24, 25 හා 26 බිම් කැබලිවලින්, දකුණින් : අංක 17 බිම් කැබැල්ලෙන් (අඩි 30 ක් පළළ ඇති පාර) සහ බස්නාහිරින් : අංක 16, 14, 13, 12 හා 11 බිම් කැබලිවලින් මායිම් වූ ද, බලයලත් මිනින්දෝරු ජී. බී. දොඩන්වෙල විසින් සාදන ලද අංක 5280 හා 2005 ජනවාරි මස 07 වැනි දින දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම තුනයි අටකින් (පර්. 11.38) යුක්ත වූ ද, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 1567/40 වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, "බෲක්ලන්ඩ් එස්ටේට්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් අංක 5280 දරන මැනුම් පිඹුරේ නිරූපිත, අංක 18 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කරන ලද (අඩි 20 ක් පළල ඇති පාර) බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, අතුරුගිරිය පිහිටා ඇත්තා වූ ද, උතුරින් : අංක 26 බිම් කැබැල්ලෙන්, නැගෙනහිරින් : මෙහි අංක 26 බිම් කැබැල්ලෙන්, දකුණින් : මෙහි අංක 28, 29 හා 30 බිම් කැබලිවලින් සහ බස්නාහිරින් : අංක 17 බිම් කැබැල්ලෙන් (අඩි 30 ක් පළල ඇති පාර) මායිම් වූ ද, බලයලත් මිනින්දෝරු ජී. බී. දොඩන්වෙල විසින් සාදන ලද අංක 5280 හා 2005 ජනවාරි මස 07 වැනි දින දරන මැනුම් පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් දෙකයි දශම හයයි හතරකින් (පර්. 2.64) (හෙක්ටයාර් 0.0067) කින් යුක්ත වූ ද, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 1567/210 වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, "බෲක්ලන්ඩ් එස්ටේට්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් එකී අංක 5280 දරන මැනුම් පිඹුරේ නිරූපිත, අංක 27 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කරන ලද (අඩි 10 ක් පළල ඇති පාර) බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල වේ.

*ඉඩමට පිවිසීම.-* හෝමාගම නගර මධ්‍යයේ සිට අතුරුගිරිය පාර ඔස්සේ හතරමං හංදියක් වන වල්ගම හංදිය හමුවන තුරු කිලෝමීටර් 3.3 ක් පමණ ගමන් කර හංදියේ සිට වම් අත පැත්තේ ඇති තල්දියවල පාර හමුවන තුරු මීටර් 200 ක් පමණ ඥාණවිමල පාර ඔස්සේ අතුරුගිරිය දෙසට ඉදිරියට ගමන් කරන්න. ඉන්පසු වමට හැරී රබර් වත්තකට යාබදව දකුණු අත පැත්තේ ඇති "බෲක්ලන්ඩ් එස්ටේට්" දෙසට මග පෙන්වන පාරක් හමුවන තුරු තල්දියවල පාර ඔස්සේ මීටර් 850 ක් පමණ ගමන් කරන්න. එතැනින්, දකුණට හැරී එකී පාර ඔස්සේ මීටර් 200 ක් පමණ ගමන් කර ඉන්පසු වංගුවක් සමග දකුණට හැරී පාර විෂයගත දේපළ වංගුව පසුවනවාත් සමග වම් අත පැත්තේ දැකිය හැක. හැරවුම් ලක්ෂ්‍යයේ සිට තනි තට්ටුවේ නේවාසික ගොඩනැගිල්ලක් ඇති දෙවන ඉඩම් කට්ටිය එය වේ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

01. ගැණුම්කරුවන් විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%),
02. පළාත් සභා ගාස්තු හෝ රජයේ ගාස්තු,
03. නොතාරිස් ගාස්තු, ගමන් ගාස්තු සහ විකිණීමේ කොන්දේසි සකස් කිරීමේ ගාස්තුව රු. 10,500/-,
04. සියලුම ප්‍රචාරක වියදම්,

05. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු (සිවිල් නීති සංග්‍රහයේ 258 වගන්තිය අනුව),
06. ලිපිකරු, බෙරකරු සහ සෝෂක ගාස්තුව රු.4,500/-
07. ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑපහ (75%) මුදල දින 30 ක් ඇතුළත දී කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත සඳහන් නඩුවට තැන්පත් කළ යුතුයි.

ඔප්පු පරීක්ෂා කිරිම සහ වෙනත් විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු, තක්සේරුකරු හා
උසාවි කොමසාරිස් වාණිජ මහාධිකරණය සහ
කොළඹ දිසා අධිකරණයේ සහ ගාල්ල දිසා අධිකරණයේ
බලයලත් වෙන්දේසිකරු රාජ්‍ය හා වාණිජ බැංකු,

අංක 7/1/10, 1 වන මහළ,
සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
බොරැල්ල, කොළඹ 08.
දුරකථන : 011-2396520
ඊ මේල් : senaservice84@gmail.com

සමරරත්න ඇසෝසියේට්ස්,
නීතිඥවරු සහ නොතාරිස්වරු,
අංක 810, 2 වන මහල,
මරදාන පාර, කොළඹ 10.
දුරකථන : 011267262/0112672263
ෆැක්ස් : 0112683073

07 - 303

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2024 වර්ෂය** | | | |
| **ජූලි** | 2024.07.05 | සිකුරාදා | 2024.06.20 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2024.07.12 | සිකුරාදා | 2024.06.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.07.19 | සිකුරාදා | 2024.07.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.07.26 | සිකුරාදා | 2024.07.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2024.08.02 | සිකුරාදා | 2024.07.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.08.09 | සිකුරාදා | 2024.07.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.08.16 | සිකුරාදා | 2024.08.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.08.23 | සිකුරාදා | 2024.08.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.08.30 | සිකුරාදා | 2024.08.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2024.09.06 | සිකුරාදා | 2024.08.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.09.13 | සිකුරාදා | 2024.08.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.09.20 | සිකුරාදා | 2024.09.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.09.27 | සිකුරාදා | 2024.09.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.